# තරුණයින් මනෝවර්ථක ඖෂධ භාවිතයට යොමුවීම සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා සහ රටා

භද්‍රානි සේනානායක*, නිලානි රේණුකා, ඒ ඒ සජීව අතාවුද
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
*badrani@nddcb.gov.lk

තරුණ අවධියේදී ජීව විද්‍යාත්මක වශයෙන් සිදුවන වෙනස්කම් සහ සමාජීය වශයෙන් මුහුණදෙන බලපෑම් හේතුවෙන් තරුණයින් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වන බව සමාජ පර්යේෂකයින් සිය අධ්‍යයන තුළින් අනාවරණය කර ඇත. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රවණතා සහ රටා කාලයෙන් කාලයට වෙනස්කම් වලට ලක්වන අතර, මෑතකාලීන මත්ද්‍රව්‍ය ආශ්‍රිතව ප්‍රවණතාවක් වශයෙන් මනෝවර්ථක (Psychotropic Substances) හා මනෝකාරක ඖෂධ (Psychoactive Substances) අවභාවිත කිරීම හඳුන්වා දිය හැකිය. ජාවාරම්කරුවන් විසින් සූක්ෂ්ම ව තරුණයින් මනෝවර්ථක ඖෂධ භාවිතය සඳහා පොළඹවා ගැනීමට කටයුතු කරමින් සිටිති. මෙම පසුබිම මූලික කරගනිමින් වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ වර්ග තරුණයින් විසින් අවභාවිත කිරීමක් සිදු කරන්නේද? අවභාවිත කරන්නේ නම්, එහි ස්වභාවය හා ඒ ආශ්‍රිත නූතන ප්‍රවණතා මොනවාද? යන ගැටළු අධ්‍යයනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. තරුණයින් මනෝවර්ථක ඖෂධ භාවිත කිරීමට බලපා ඇති හේතු හඳුනා ගැනීමත් භාවිතය සඳහා යොමු වී තිබෙන වයස් මට්ටම හා එම පුද්ගලයින් ජීවත්වන දිස්ත්‍රික්ක හඳුනා ගැනීමත් අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.
සමීක්ෂණ ක්‍රමය පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගනිමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්ෂේත්‍ර දත්ත විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස කොළඹ, කලුතර, ගම්පහ, මහනුවර, ගාල්ල, මාතර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, රත්නපුර යන දිස්ත්‍රික්ක තෝරා ගන්නා ලදී. පර්යේෂණය සඳහා පුද්ගලයින් 1000 කින් සමන්විත නියැදියක් තෝරා ගත් අතර, දත්ත එක්රැස් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ද සම්මුඛ සාකච්ඡාව සහ සහභාගීත්ව නිරීක්ෂණය වැනි ශිල්ප ක්‍රම යොදා ගන්නා ලදී. අධ්‍යයන අනාවරණයන්ට අනුව පුද්ගලයින් 58%ක් වයස අවුරුදු 16 - 20 අතර වයස් සීමාවේ දී ද 8% ක් අවුරුදු 11 - 15 අතර සීමාවේ දී ප්‍රථම වතාවට භාවිත කර ඇති බවට අනාවරණය විය. නියැදියේ පුද්ගලයින් බහුලව භාවිත කර තිබෙන ඖෂධ වර්ග ලෙස Tramadol, PreGabaline, Diazipam/ Stelazene, MDMA (Ecstasy), Morphine, Corex D, වැනි ඖෂධ හඳුන්වා දිය හැකිය. ඖෂධ ප්‍රථම වතාවට භාවිත කිරීමට බලපෑ හේතු ලෙස කුතුහලය, මිතුරු බලපෑම, සතුට හා විනෝදය, වෙනත් මත්ද්‍රව්‍යවලට ආදේශකයක් ලෙස භාවිත කිරීම, ගැටලු මඟ හරවා ගැනීමට, ලිංගික තෘප්තිය සඳහා භාවිත කර ඇත. පුද්ගලයින්ගෙන් 81%ක් මිතුරන් මාර්ගයෙන් ඖෂධ ලබා ගෙන ඇති බව අනාවරණය විය. තරුණයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි ජීව විද්‍යාත්මක සාධක වලට වඩා සමාජීය කරුණු බලපා ඇති බව මෙමඟින් අනාවරණය වේ.

**ප්‍රමුඛ පද:** මනෝවර්ථක හා මනෝකාරක ඖෂධ; මත්ද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රවණතා සහ රටා; මිතුරු බලපෑම; තරුණයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය